සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II,III | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.

## I කොටස

(01) අංක (i) සිට (v) තෙක් කොටස් කියවා අසා ඇති (අ, ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "දරු පෙම් මුණුබුරු පෙම් ඇත්තේ මට මතු නො වන්නේ වේද කාටත් සරිය"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) දරු පෙම් මුණුබුරු පෙම් යනුවෙන් අදහස් කරන්නේ කවුරුන් පිළිබඳව ද?

(ii) "කීප දවසකින් සැකයක් නොසිතුව මැනව, කීප දවසකින් උන් නුඹ වහන්සේ වශයට පමුණුවා සාමාර්ථ්‍යය දක්වා ලමි"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?

(ආ) "උන්" යනුවෙන් අදහස් කරන්නේ කවුරුන් ද?

(iii) "මට තාම කඩල මිලවත් හොයාගන්න බැරි වුණා" යි ඔහු සිතයි."

(අ) ඔහු යනුවෙන් අදහස් කරන්නේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් ද?

(iv) පැයකදි එකට හමු වන දුර ඇත          දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙද          කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ          ඔතන
බේදය පිළිස්සී හමු වේවා          දකුණ

(අ) මෙම කවිය ඇතුළත් පද්‍ය පන්තියේ රචකයා කවරෙක් ද?

(ආ) එම රචකයා විසින් රචනා කොට ඇති කෘතියක් නම් කරන්න.

(v) තිරසර ගුණෙන් යුතු උතුමකු හට          පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක          සුනෙර
පුවතර මෙ දඹදිව මළුවෙක සිය          ගෙදොර
ඔහුකර නොවන සැපතෙක් එබැවින්          කවර

(අ) කිඳලෙක, සුනෙර යන පදවල අර්ථ ලියන්න.

(ආ) මෙම කවියේ අදහස ලියන්න. (ලකුණු 04 x 05 = 20යි)

(02) පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොටගෙන රසාස්වාදයක් ලියන්න.

පෙරදිග ගොරහැඩි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුලු හෙලනවා.

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයටම

(i) උදෑසන කාව්‍යය සඳහා කවියා භාවිත කොට ඇති අනුභූතිය කුමක් දැයි විස්තර කරන්න.

(ii) තම කවි පන්තිය සජීවී ගුණයෙන් ඉදිරිපත් කිරීම සඳහා කවියා භාවිත කොට ඇති රචනා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(iii) තම අත්දැකීම ප්‍රකාශයට පත් කිරීමට කවියා යොදාගෙන ඇති කාව්‍ය ආකෘතිය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(iv) ''කවියා උපමා භාවිතයෙන් තොර රූපකාර්ථ භාෂාවක් භාවිතයට ගෙන තිබේ.'' විමසන්න.

(v) "කවිය තුළින් මතුවන ව්‍යංග්‍යාර්ථ ප්‍රබල ය" මෙම අදහස අදාළ කවිය තුළින් පැහැදිලි කරන්න. (ලකුණු 25)

## II කොටස

(03) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් "පාත්‍රය හැර ගත මැනව'යි නො කියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකැ යි සිතුහ. බුදුහු එතන දීත් පාත්‍රය හැර නොගත් සේක් හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ යි සිතා යන කලට එතන දීත් හැර නොගන්නා රඳනු කැමැතිවත් අභිප්‍රායකින් ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව යි කියා ගත නොහී මෙතනදී හැර ගන්නා සේක. මෙතන දී හැර ගන්නා සේක් වනැයි සිතා ම නොසිතින් ගියත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

ඒ වේලෙහි නන්ද කුමරුවන්ගේ දනවු කලණ නම් වූ කුමාරයන්ට සරණ නිල වූ මුල් නෑ කම කවරේ වුවත් රජ කම් හෙයින් බැදෑණියන් ළඟට මිනිස්සු ගොසින් බුදුහු පිය රජ්ජුරුවන්ගේ

මාලිගාවට වැඩි ගමනේ මුඹදෑගෙන් වෙන් කොට නන්ද කුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩනා සේකැ යි කිවූ ය. එබස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තෝ සෝධා නො නිමි හිස කේ නා බැඳ, වහා අවුත් "ගියත් සිළු ගෙයි, වහා එව' යි කිවූ ය. උන් කියා ලූ බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි, මහණ වවු දැ'යි වදාළ සේක.

(i) බුදුන් වහන්සේ නන්ද කුමරුන් අතට පාත්‍රය දෙන්නේ කුමන අරමුණක් අරභයාද? ඒ සඳහා ගත් පියවර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii) මෙහි භාවිත කොට ඇති උපමාවක් උපුටා දක්වන්න. (ලකුණු 05)

(iii) නන්ද කුමරු පාත්‍රය රැගෙන යන්නේ කුමන සිතුවිල්ලකින් ද? (ලකුණු 05)

(iv) කතාකරු අපූර්වත්වයකින් යුතුව භාෂාව හසුරුවා ඇති බව නිදසුන් දෙකක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

නැතහොත්,

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බඹන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව 'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර

(i) ''දිසාපති කාමරේ දීය'' කාව්‍යය සඳහා වස්තු විෂය වී ඇත්තේ කුමක් ද? (ලකුණු 05)

(ii) 'කිවිදිය යොදාගෙන ඇති සරල භාෂාව කවිය රසවත් වීමට හේතු වී තිබේ.' කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) කවි පෙළේ සාර්ථකභාවය රැක ගැනීම සඳහා කවියා යොදාගෙන ඇති කාව්‍යෝක්ති කවරේ ද? (ලකුණු 05)

(iv) 'දෙපද කාව්‍ය ආකෘතිය කවිය රසවත් වීමට හේතු වී ඇත.' විමසන්න. (ලකුණු 10)

## III කොටස

**මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.**

**(එක් උත්තරයක වචන 100ක්වත් තිබිය යුතු ය.)**

(04) 'වැලපීම කෙටිකතාව පරිවර්තන කෙටිකතාවක් වුවත් එය සාර්ථක වී ඇත්තේ භාවිත කර ඇති භාෂා ශෛලිය හේතුවෙනි' නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

(05) 'ඇත්ගාලේ දරු පෙම කාව්‍යය සාර්ථක නිර්මාණයකි.' නිදසුන් තුනක්වත් දක්වමින් විවරණය කරන්න.

(ලකුණු 15)

(06) 'ජනකවියා අවස්ථාවට උචිත ලෙස නිර්ව්‍යාජ අත්දැකීම් කාව්‍ය නිර්මාණයට යොදාගෙන තිබේ.' නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(07) 'කුස ජාතකය රසවත් කතාවක් ලෙස ඉදිරිපත් කිරීමට අතුරු කතා භාවිත කොට තිබේ.' නිදසුන් තුනක් මගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(ලකුණු 15 × 2 = 30)